# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1688/28 - 2011 ජනවාරි 14 වැනි සිකුරාදා - 2011.01.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.–බී.11/80.

**1980 අංක 26 දරන ආහාර පනත**

1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය ප්‍රකාර, ආහාර උපදේශක කමිටුව විමසා, සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

මෛත්‍රිපාල සිරිසේන,
සෞඛ්‍ය අමාත්‍ය.

2010 ජනවාරි මස 08 වැනි දින,
කොළඹ,
සෞඛ්‍ය අමාත්‍යාංශයේ දී ය.

නියෝග

2009 ජනවාරි මස 23 වන දින අංක 1585/26 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මගින් සංශෝධනය කරන ලද, 2006 නොවැම්බර් මස 23 වැනි දින අංක 1472/19 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 2006 "ආහාර (වර්ණ ගැන්වීමේ ද්‍රව්‍ය) නියෝග" පහත සඳහන් පරිදි වැඩිදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි 5 වැනි නියෝගයේ (iv) වැනි ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :–
" (iv) මත්ස්‍ය, මෘද්වංගීන් (මොලුස්කාවන්) ක්‍රස්ටේසියාවන් සහ සෙලවර්මීන් (එකයිනොඩර්මීන්) ;"

(2) එහි 1 වැනි උපලේඛනයේ I වැනි සහ II වැනි වගු ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන වගු ආදේශ කිරීමෙන් :–

"*I වැනි වගුව*

*ආහාර වර්ණ ගැන්වීමේ ද්‍රව්‍ය ලෙස යොදා ගත හැකි අනුමත කෘත්‍රිම වර්ණ ගැන්වීමේ ද්‍රව්‍ය*

| අංකය | *I වැනි තීරය* වර්ණය | *II වැනි තීරය* පොදු නාමය | *III වැනි තීරය* ජාත්‍යන්තර අංකන ක්‍රමය අනුව අංකය (*INS*) |
|---|---|---|---|
| 1 | රතු | 1 කාමොසින් (ඇසොරුබයින්)<br>2 පොන්සියු 4 ආර්<br>3 එරිත්‍රොසින්<br>4 ඇලුරා රෙඩ් | 122<br>124<br>127<br>129 |
| 2 | කහ | 1 සන් සෙට් යෙලෝ - එෆ්.සී.එෆ්<br>2 ටාට්‍රසින් | 110<br>102 |
| 3 | නිල් | 1 ඉන්ඩිගොටින් (ඉන්ඩිගෝ කාමයින්)<br>2 බ්‍රිලියන්ට් බ්ලූ - එෆ්.සී. එෆ්. | 132<br>133 |
| 4 | කොළ | 1 ෆාස්ට් ග්‍රීන් - එෆ්.සී. එෆ්. | 143 |

## *II* වැනි වගුව

**අනුමත කර ඇති වෙනත් වර්ණ ගැන්වීමේ ද්‍රව්‍ය**

| අංකය | *I වැනි තීරය*<br>*ස්වාභාවික වර්ණ ගැන්වීමේ ද්‍රව්‍ය* | *II වැනි තීරය*<br>*ජාත්‍යන්තර අංකන ක්‍රමය අනුව අංකය (INS)* |
|---|---|---|
| 1 | කර්කියුමින් | 100 (i) |
| 2 | රයිබොප්ලෙවින් 5' පොස්පේට්, | 101 (i) |
| 3 | රයිබොප්ලෙවින් 5' පොස්පේට්, සෝඩියම් | 101 (ii) |
| 4 | කොචිනිල් ( කාමිනික් අම්ලය, කාමින්ස් ) | 120 |
| 5 | ක්ලෝරොෆිල්ස් | 140 |
| 6 | ක්ලෝරොෆිල්ස් කොපර් කම්ප්ලෙක්ස් | 141 (i) |
| 7 | කැරමල් I පංතිය | 150a |
| 8 | කැරමල් III පංතිය | 150c |
| 9 | කැරමල් IV පංතිය | 150d |
| 10 | කැරෝටින්ස් ස්වාභාවික සාරය (එළවළු) | 160a (ii) |
| 11 | ඇනාටෝ සාරය | 160b |
| 12 | පැප්‍රිකා ඔලියොරෙසින් (කැප්සන්තින් හෝ කැප්සොරුබින්) | 160c |
| 13 | ලයිකොපීන් | 160d |
| 14 | කැරොටිනල් ; බීටා ඇපෝ -8' | 160e |
| 15 | කැරොටිනොයික් අම්ලය, බීටා - ඇපෝ-8' වල මීතයිල් හෝ එතිල් එස්ටර් | 160f |
| 16 | ප්ලෙවොසැන්තින් | 161a |
| 17 | කැන්තසැන්තීන් | 161g |
| 18 | බීට් රෙඩ් (බෙටනින්) | 162 |
| 19 | ඇන්තොසයනීන් | 163(i) |
| 20 | ග්‍රේප් ස්කින් එක්ස්ට්‍රැක්ට් | 163(ii) |
| 21 | ටයිටේනියම් ඩයොක්සයිඩ් | 171 ” |

01-695

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.